# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,419 - 2025 ජනවාරි මස 10 වැනි සිකුරාදා - 2025.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : II (ආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 48 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... | 56 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 57 |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

47 - B 082644 — 5,403 (2025/01)
F 1 -

# බඩු බාහිරාදිය විකිණීම්

**උතුරු පළාත්බද මහාධිකරණය - යාපනය**

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

යාපනය මහාධිකරණ නඩුවල රාජසන්තක කරන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2025.01.25** වැනි දින **පෙ.ව. 10.00** ට යාපනය මහාධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිතය.

යාපනය මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ.ව. 9.00 ට පෙර පහත සඳහන් නඩු භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම නඩු භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් එම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම නඩු භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම නඩු භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහි දී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාර ගනු නොලැබේ.

වෙන්දේසි භූමියට පැමිණෙන අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතුය.

ඩී. එස්. සූසයිතාස්,
මහාධිකරණ විනිසුරු,
උතුරු පළාත්බද මහාධිකරණය - යාපනය.

2024 දෙසැම්බර් මස 16 වැනි දින,
උතුරු පළාත්බද මහාධිකරණය - යාපනය.

List of Articles and the estimated valuation of Articles for Public Auction

*Motor Vehicles*

| *S. No.* | *Case No.* | *Registration No.* | *Vehicle Class* | *Engine No.* | *Chassis No.* | *Estimated Value* |
|---|---|---|---|---|---|---|
| 01. | 3261/22 | NP BAG - 7763 | Motor cycle | SF1P47FMD00004499 | SAFARY4S000004499 | Rs. 12,500.00 |
| 02. | 2165/17 | NPYS - 9271 | Motor tricycle | AFMBUG50254 | MD2AAAAZZUWG95461 | Rs. 160,000.00 |
| 03. | 3184/21 | NP LK - 5307 | Motor Lorry | 497SPTC35KXY667541 | MAT357524C8R39807 | Rs. 725,000.00 |

*Boat*

| *S. No.* | *Case No.* | *Boat No.* | *Length* | *Beam* | *Estimated Value* |
|---|---|---|---|---|---|
| 04. | 3201/22 | OFRP-A-1648MNR | – | – | Rs. 10,000.00 |

*Out Board Engine*

| *S. No.* | *Case No.* | *Model* | *Horse Power* | *Engine No.* | *Estimated Value* |
|---|---|---|---|---|---|
| 05. | 2003/16 | Suzuki | 9.9 HP | 371736 | Rs. 10,000.00 |

*Other Productions Items*

| *S. No.* | *Case No.* | *Productions* | *Estimated Value* |
|---|---|---|---|
| 06. | 2798/19 | 01. Red Colour Jack<br>02. Red Colour Spanner<br>03. Black Colour Spanner<br>04. Grinder<br>05. Keys | Rs. 100.00<br>Rs. 120.00<br>Rs. 100.00<br>Rs. 200.00<br>Rs. 50.00 |
| 07. | 3259/22 | A Wooden Axe - 01 | Rs. 300.00 |

01 - 31

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - පස්සර**

නඩු භාණ්ඩ ලෙස අධිකරණය වෙත ඉදිරිපත් කර රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

පස්සර මහෙස්ත්‍රාත් අධිකරනයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොපාන ලද හා භාවිතයෙන් ඉවත් කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් භාණ්ඩ **2025.01.18 වැනි සෙනසුරාදා දින පෙ.ව. 10.00** ට පස්සර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු සිටී නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ වීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසිය ආරම්භ වූ පසු කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. පස්සර මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින වෙන්දේසියට අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළි නොගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි, එම භාණ්ඩ වෙන්දේසියේ විකිණීමෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් හා මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගැනීම සඳහා පැමිණෙන අය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කල යුතුය.

උදිත එස්. ගුණතිලක,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - පස්සර.

2024 දෙසැම්බර් මස 24 වැනි දින,
පස්සර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව**
**මහේස්ත්‍රාත් අධිකරණය - පස්සර**

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01 | 1531 | වතුර මෝටර් 01 |
| 02 | 43630 | හැමර් යන්ත්‍ර 01<br>අලවංගු 02<br>උදළු 02<br>ඉල්ලංකුරු 01<br>යකඩ තාච්චි 01<br>රබර් බට 01<br>කුළු ගෙඩි 01<br>වයර් කෝඩ් 01 |
| 03 | 43648 | එල් අයිරින් බාර් 05 |
| 04 | 2800 | උදළු 01<br>ඉල්ලංකුරු 02<br>කුළු ගෙඩි 01 |
| 05 | 28629 | කැසට් රෙකෝඩර් 01 (කාර් කැසට්) |
| 06 | 50790 | 10 kg කටු කම්බි රෝල් 01<br>අලවංගු 01 |
| 07 | 22102 | ඉල්ලංකුරු 01 |
| 08 | 2579 | වේවැල් කුඩ 01<br>උදළු 01 |
| 09 | 2593 | කැට කුඩ 01 |
| 10 | 2918 | කැට කුඩ 01 |
| 11 | 2917 | උදළු 01 |
| 12 | 2489 | ප්ලාස්ටික් කෑන් 01<br>ප්ලාස්ටික් බූලි 01<br>ඇලුමිනියම් තාච්චි 01<br>ඇලුමිනියම් මුට්ටි 01 |
| 13 | 2029 | තහඩු බැරල් 01 |
| 14 | AR 1113/24 | තහඩු බැරල් 02 |
| 15 | AR 1069/24 | තහඩු 1/2 බැරල් 01<br>තහඩු බැරල් 01 |
| 16 | 2519 | තහඩු බැරල් 01 |
| 17 | 2515 | තහඩු බැරල් 01 |
| 18 | AR 1114/24 | තහඩු බැරල් 01<br>ප්ලාස්ටික් බැරල් 01<br>ප්ලාස්ටික් බකට් 02 |

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 19 | 2856 | ප්ලාස්ටික් බූලි 01 |
| 20 | 2625 | ප්ලාස්ටික් බූලි 06 |
| 21 | 2529 | ප්ලාස්ටික් බූලි 02 |
| 22 | 2958 | ප්ලාස්ටික් බූලි 01 |
| 23 | 2698 | ප්ලාස්ටික් බූලි 01 |
| 24 | 2748 | ප්ලාස්ටික් බූලි 01 |
| 25 | 2761 | ප්ලාස්ටික් බූලි 01 |
| 26 | 1982 | ප්ලාස්ටික් බූලි 02 |
| 27 | 2959 | ප්ලාස්ටික් කෑන් 01 |
| 28 | 2963 | ප්ලාස්ටික් කෑන් 01 |
| 29 | 2529 | 12.5 kg ගෑස් සිලින්ඩර් 01<br>5 kg ගෑස් සිලින්ඩර් 01<br>රබර් බට 01<br>වැල් 04 ගෑස් ලිප් 01 |
| 30 | 2961 | ප්ලාස්ටික් බැරල් 01 (කුඩා ප්‍රමාණයේ)<br>ප්ලාස්ටික් බකට් 01 (25 L) |
| 31 | අංක රහිත | ඇස්බැස්ටෝස් තහඩු<br>අඩි 10 - 08<br>අඩි 08 - 10<br>අඩි 06 - 09<br>අඩි 02 - 09 |
| 32 | අංක රහිත | රේල් පිහිලි 04 |
| 33 | අංක රහිත | දිරාගිය ටකරන් තහඩු |
| 34 | අංක රහිත | දිරා ගිය නඩු භාණ්ඩවල යකඩ කොටස් |
| 35 | අංක මැකී ඇති | ප්ලාස්ටික් කෑන් 25 |
| 36 | අංක රහිත | දිරාගිය ටකරන් 05 |
| 37 | AR 768 | ප්ලාස්ටික් බැරල් 01 |
| අධිකරණයේ භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ලැයිස්තුව | | |
| 38 | වහලයෙන් ඉවත් කරන ලද උළු කැට 1800 | |
| 39 | විවිධ ප්‍රමාණයේ දිග රිප්ප පටි (2x1) 100 | |
| 40 | භාවිතයෙන් ඉවත් කරන ලද රිජින් පටි<br>1. අඩි 8 ක් පමණ දිග 01<br>2. අඩි 8 ක් පමණ දිග 01 | |
| 41 | දිරා ගිය ජනේල 03 | |
| 42 | ලී අත් වැටවල් 02 | |

01 - 42

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - පොතුවිල්**

රාජසන්තක කරන ලද ගංගා වැලි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

පොතුවිල් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද පහත සඳහන් නඩු භාණ්ඩ (ගංගා වැලි) **2025.01.18 වැනි දින පෙ.ව. 9.30** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ගංගා වැලි සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසියට එකී වැලි ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතුය.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත වැලි රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිවේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි, එම වැලි වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුවේ.

04. වෙන්දේසියන් මිල දී ගන්නා වැලි සඳහා ඒ අවස්ථාවේ දී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතුය.

05. වෙන්දේසි භූමියට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

එම්. කේ. එම්. හිල්මි,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - පොතුවිල්.

2025 ජනවාරි මස 01 වැන දින,
පොතුවිල් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය

| *වෙන්දේසියට නියමිත භාණ්ඩ* | *ප්‍රමාණය* |
|---|---|
| ගංගා වැලි | කියුබ් 36 යි |

01 - 43

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - නිකවැරටිය**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ
ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියෝග කරන ලද පහත සඳහන් යතුරු පැදි සහ භාණ්ඩයන් 2025.01.25 වැනි දින පෙ.ව. 9.30 ට නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් වන කිසියම් යතුරු පැදි සහ භාණ්ඩයන් පිළිබඳව හිමිකම් කියාපාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 ට පෙර වෙන්දේසි කිරීමට නියමිත යතුරු පැදි සහ භාණ්ඩයන් පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවල අධිකරණයේ අභිමතය පරිදි එම යතුරු පැදි සහ භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා යතුරු පැදි සහ භාණ්ඩයන් සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර, සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත්/මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. වෙන්දේසි භූමියට පැමිණෙන අය තම තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

චාන්දන ලියනගේ,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - නිකවැරටිය.

2025 ජනවාරි මස 07 වැනි දින,
නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වෙනත් කරුණු | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | අංක රහිත | 137 - 6864 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 02 | අංක රහිත | NWMX 4602 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 03 | අංක රහිත | NWBCK 5025 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 04 | අංක රහිත | WP 93-1521 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 05 | අංක රහිත | NWHB 3587 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 06 | අංක රහිත | NWVX 8231 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 07 | අංක රහිත | NWJL 3417 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 08 | අංක රහිත | NWBGO 3949 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 09 | අංක රහිත | RV 3063 ලොකු ට්‍රේලරය | අමතර කොටස් ලෙස | 01 |
| 10 | අංක රහිත | රොටරිය සමග අත් ට්‍රැක්ටරය | අමතර කොටස් ලෙස | 01 |
| 11 | අංක රහිත | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය | අමතර කොටස් ලෙස | 01 |
| 12 | අංක රහිත | අත් ට්‍රැක්ටරය | අමතර කොටස් ලෙස | 01 |
| 13 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 14 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 15 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 16 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 17 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 18 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 19 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 20 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 21 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වෙනත් කරුණු | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 22 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 23 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 24 | අංක රහිත | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 25 | 50097 | NCHA 1519 රතු පාට ත්‍රිරෝද රථය | අමතර කොටස් ලෙස | 01 |
| 26 | 63281 | කලු කාර් රථය | අමතර කොටස් ලෙස | 01 |
| 27 | B/399/18 | ලොකු ට්‍රේලරය | අමතර කොටස් ලෙස | 01 |
| 28 | 37564 | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය | අමතර කොටස් ලෙස | 01 |
| 29 | 75508 | පොඩි ට්‍රැක්ටරය හා ට්‍රේලරය | අමතර කොටස් ලෙස | 01 |
| 30 | 21806/E | WPGZ 9427 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 31 | 48645/ODD | 143-2666 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 32 | 39200/MT | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 33 | 56762/ODD | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 34 | 55033/MT | NWTL 9105 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 35 | 67724/ODD | NWBAJ 0190 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 36 | 45437/ODD | NWBFV 6317 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 37 | 52701/PC | NWJU 6342 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 38 | 52642/PC | WPTF 8941 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 39 | 37217/MT | NCWB 7821 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 40 | 32160/MT | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 41 | 39987/MT | යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| 42 | 72207/PC | NWBIL 6798 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 43 | 61819 | NWBCY 1073 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 44 | 39290/F | NWLN 4858 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 45 | 36587/MISC | අංක 01, 159042 කොම්ප්‍රෙෂර් යන්ත්‍රය | වාහනයක් ලෙස | 01 |
| 46 | 48379 | NW KF 9466 සුදු කාර් රථය | වාහනයක් ලෙස | 01 |
| 47 | 67926/E | යකඩ ආධාරකය | - | 01 |
| 48 | 60717/ANI | අඩි 02 යි අඟල් 09 ක් වූ MPT වර්ගයේ රවුම් තලයක් සහිත ගල් කඩන කටර් | - | 01 |
| 49 | 72783/ANI | අඩි 10 ක බැගින් දිග ඇලුමිනියම් ඉනිමන් | - | 01 |
| 50 | 72783/ANI | අඩි 10 බැගින් දිග ඇලුමිනියම් ඉනිමන් | - | 01 |
| 51 | 72783/ANI | අඩි 48 ක් දිග අඟල් 02 ක් විෂ්කම්භය සහිත කොළ පාට ප්ලාස්ටික් වතුර බට | - | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වෙනත් කරුණු | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 52 | 72783/ANI | අඩි 65 ක් දිග අඟල් 02 ක් විෂ්කම්භය සහිත කොළ පාට ප්ලාස්ටික් වතුර බට | - | 01 |
| 53 | 72783/ANI | අඩි 22.5 දිග වයරයක් සම්බන්ධ කරන ලද W P. Ss. 2XU B2 දරන සින්ගර් වර්ගයේ අඟල් 02 වතුරේ ගිල්වන වතුර මෝටර් | - | 01 |
| 54 | 72783/ANI | ප්ලග් පෙට්ටි 03 සම්බන්ධ කරන ලද අඩි 165 ක් දිග වයර් | - | 01 |
| 55 | 72783/ANI | ප්ලග් පෙට්ටි 02 හා ප්ලග් ටොප් 01 සම්බන්ධ කරන ලද අඩි 55 ක් දිග වයර් | - | 01 |
| 56 | 72783/ANI | හෝල්ඩර් 06 හා ප්ලග් ටොප් 01 සම්බන්ධ කරන ලද අඩි 55 ක් දිග කලු වයර් | - | 01 |
| 57 | 72783/ANI | අඩි 20 බැගින් දිග කොහු කඹ | - | 02 |
| 58 | 72783/ANI | යකඩ කොක්කක් සවි කරන ලද ගැට 09 සහිත කොහු කඹ | - | 01 |
| 59 | 72783/ANI | අඟල් 23 දිග ගල විදීමට ගන්නා හිල්ටි කටු | - | 06 |
| 60 | 72783/ANI | අඟල් 31 දිග ගල විදීමට ගන්නා හිල්ටි කටු | - | 02 |
| 61 | 72783/ANI | අඟල් 18 දිග ගල විදීමට ගන්නා හිල්ටි කටු | - | 02 |
| 62 | 72783/ANI | අඟල් 29 දිග ලී මිට සවි කරන ලද රාත්තල් 14 බර කුලුගෙඩි | - | 01 |
| 63 | 72783/ANI | අඟල් 11 දිග ලී මිට සවි කරන ලද කුඩා කුලුගෙඩි | - | 01 |
| 64 | 72783/ANI | අඟල් 14.5 දිග උල් කටු | - | 01 |
| 65 | 72783/ANI | අඟල් 14.5 දිග පැතලි කටු | - | 01 |
| 66 | 72783/ANI | අඟල් 35 දිග බෝර යකඩ කූරු | - | 01 |
| 67 | 72783/ANI | අඟල් 27 දිග ලී මිට සවි කරන ලද අඟල් 07 පළල උදලු තලය සහිත උදලු | - | 01 |
| 68 | 72783/ANI | ප්ලග් ටොප් එකක් සවි කරන ලද අඩි 13 ක් දිග වයරය සම්බන්ධ කල DISHI වර්ගයේ කොල පාට හිල්ටි මැෂින් | - | 01 |
| 69 | 72783/ANI | ප්ලග් ටොප් එකක් සවි කරන ලද අඩි 15 ක් දිග වයරය සම්බන්ධ කල DISHI වර්ගයේ කොල පාට හිල්ටි මැෂින් | - | 01 |
| 70 | 72783/ANI | කලු පාට ප්ලාස්ටික් තාච්චි | - | 03 |
| 71 | 72783/ANI | සුදු පාට ප්ලාස්ටික් බකට් | - | 05 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වෙනත් කරුණු | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 72 | 72783/ANI | කහ පාට රබර් බූට් ජෝඩු | - | 01 |
| 73 | අංක රහිත | බෝට්ටුව | - | 01 |
| 74 | අංක රහිත | ඔරුව | - | 01 |
| 75 | අංක රහිත | ප්‍රධාන දොර | ඉවතලන | 01 |
| 76 | අංක රහිත | බිත්ති ලාම්පු (අබලි) | ඉවතලන | 07 |
| 77 | අංක රහිත | ගලවන ලද දොරගුලු | ඉවතලන | 12 |
| 78 | අංක රහිත | දොරවල් | ඉවතලන | 05 |
| 79 | අංක රහිත | තහඩු සින්ක් | ඉවතලන | 01 |
| 80 | අංක රහිත | පෝසිලේන් සින්ක් | ඉවතලන | 03 |
| 81 | අංක රහිත | කොමඩ් (අබලි) | ඉවතලන | 02 |
| 82 | අංක රහිත | ගලවන ලද බට කැබලි සහ ෂවර් (අබලි) | ඉවතලන | - |
| 83 | අංක රහිත | අනවශ්‍ය ටැප් කැබලි සහ බට කැබලි | ඉවතලන | - |
| 84 | අංක රහිත | කණ්ණාඩි | ඉවතලන | 02 |
| 85 | අංක රහිත | පා පැදිය | - | 01 |

01 - 198

---

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2024 දෙසැම්බර් 27 වැනි දින සංස්ථාගත කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ඉන් දා සර්ඩ් (පීවීටී) එල්ටීඩී |
| ලියාපදිංචි අංකය | : | PV 00318221 |
| ලියාපදිංචි කාර්යාල ලිපිනය | : | අංක 835/2B, 01 වැනි මහල, නව පාර්ලිමේන්තු පාර, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ. |

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

මින්නේරිපිටියගේ දොන් සංඛ මනීෂ කරුණාරත්න,
සමාගම් ලේකම්.

අංක 97/A, කඩවත පාර,
කළුබෝවිල.

01 - 51

**දැන්වීමයි**

ඒ. පී. අයි ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී.වී. 6522) සමග ඒ පී අයි ට්‍රේඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී.වී. 6215) ඒකාබද්ධ කිරීම.

2007 අංක 07 දරන සමාගම් පනතේ 241 ප්‍රකාර ඉහත කී සමාගම් එකම නෛතික ආයතනයක් බවට පත් වන බවත්, එය ඒ පී අයි ට්‍රේඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී.වී. 6215) නමින් ඉදිරියට ක්‍රියාත්මක වන බවටත් ඉහත සඳහන් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් සම්මුතියකට එළඹ ඇත. මෙම ඒකාබද්ධ කිරීම 2025 මාර්තු 01 වැනිදා හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන දිනයක සිට බල පැවැත්වේ.

ඉහත කී ඒකාබද්ධ කරනු ලබන සමාගම්වල යම් කොටස් හිමියෙකු හෝ ණය හිමියෙකු හෝ එකී සමාගම් බැඳීමකට යටත් වී ඇති යම් තැනැත්තෙකු හෝ විසින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරන වේලාවලදී පරීක්ෂා කර බැලීම සඳහා ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් ඒකාබද්ධ කරනු ලබන සමාගම්වල ලියාපදිංචි කළ කාර්යාලවලදී (අංක 39, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 03 සහ අංක 56, ධර්මපාල මාවත, කොළඹ 07) ලබා ගත හැකි අතර ඒකාබද්ධ කරනු ලබන සමාගමක් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ගෙවීමකින් තොරව ලබා ගැනීමේ හිමිකම එකාබද්ධ කරනු ලබන සමාගම්වල යම් කොටස් හිමියෙකු හෝ ණය හිමියෙකු හෝ එකී සමාගම් බැඳීමකට යටත් වී ඇති යම් තැනැත්තෙකුට ඇත.

ඒ පී අයි ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඒ පී අයි ට්‍රේඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. ජී. කෝපරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01 - 184

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

වාණිජ මහාධිකරණයේ දී ය

**ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියයි**

ලංකා ඔරික්ස් ලීසිං කම්පැණි පීඑල්සී,
(කලින් ලංකා ඔරික්ස් ලීසිං කම්පැණි ලිමිටඩ්)
යනුවෙන් නම් කරන හඳුන්වනු ලැබූ
අංක 100/1-1/1,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය. (සමාගමේ නව අංකය PQ 70)

........................... *පැමිණිලිකරු.*

*එදිරිව*

1. ක්‍රිස්ටි ලංකා ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
   අංක 78, 4 වන මහළ, මුක්තා ප්ලාසා,
   ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14.

2. දිල්ශාන් නේරුස් රොජර් ප්‍රනාන්දු,
   අංක ඒ 21/2, රෝයල් පාර්ක්,
   ලේක් ඩ්‍රයිව්, රාජගිරිය.

*දෙවන විත්තිකරුගේ නව ලිපිනය*

අංක. 37-24 බී,
ෆෙයාර්මවුන්ට් රෙසිඩන්සි,
බුත්ගමුව පාර, රාජගිරිය.

3. ගන්හේවගේ මනෝහාරි වත්සලා ප්‍රනාන්දු,
අංක ඒ 21/2, රෝයල් පාර්ක්,
ලේක් ඩ්‍රයිව්, රාජගිරිය.

........................... *විත්තිකරුවන්.*

සිවිල් වානිජ මහාධිකරණයේ නඩු අංක : HC (සිවිල්) 08/2009/MR

වර්ෂ 2012 ක් වූ ජනවාරි මස 31 වැනි දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව එකී 2 වන 3 වන විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට එක්ව සහ හෝ වෙන්වෙන්ව අයකර ගන්නට කියා නිම කළ රුපියල් 18,344,387 ක මුදලක් සහ රුපියල් 17,915,456 ක මුදලක් සහ ඒ මත 2008.09.17 වැනි දින සිට තීන්දු ප්‍රකාශ දින තෙක් මසකට 4 % බැගින් පොළිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොලිය සහ නඩු ගාස්තු අය කරවා ගැනීම සඳහා ද, 2 වන සහ 3 වන විත්තිකරුවන්ගේ නිශ්චල සහ චංචල දේපළ, ගෙවල්, ඉඩම්, බඩු මුට්ටු, අයවිය යුතු ණය සහ බැරකම් තහනම් කිරීමෙන් සහ අවශ්‍ය වුවහොත් විකිණීමෙන් ලබා ගැනීමට ද, ඉහත නම් සඳහන් 2 වන සහ 3 වන විත්තිකරුවන් විසින් එක්ව සහ හෝ වෙන් වෙන්ව පැමිණිලිකරුට එම අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරන ලද නඩු ගාස්තු අයකර ගැනීම සඳහා ද, පහත උපලේඛනයේ තහනමට ගෙන ඇති දේපළ ක්‍රියාවේ යෙදවීමෙහිලා මෙහි වූ උපලේඛනයේ සවිස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රයක් වෙන්දේසියේ විකිණීමෙන් එකී තහනම් නියෝගයේ වඩාත් සම්පූර්ණ ලෙස විස්තර කර ඇති ඉඩම සහ ස්ථානය මෙම නඩුවේ තීන්දුව ප්‍රකාරව විකුණනු ලැබ විකිණීමෙන් ලත් මුදල මෙම නඩු කටයුත්තෙහි බැරට අධිකරණය වෙත ගෙනෙනු ලැබිය යුතු බවට තවදුරටත් නියෝග කරනු ලබන හෙයින් ද,

තවද අධිකරණය විසින් අනුමත කරනු ලැබිය යුතු විකිණීමේ කොන්දේසිවලට යටත්ව එකී ඉඩම හා ස්ථානය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ ක්‍රියාවේ යොදවනු පිණිස මෙම අධිකරණය විසින් මා නම් කොට පත් කරනු ලබනු ඇති හෙයින් ද, එකී තහනම් නියෝග වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති ඉහත කී ඉඩමට සහ ස්ථානය වෙත ඇතුළු වීමටත් පළමු කොට එකී ඉඩමේ තක්සේරු වාර්තාව සකස් කොට ඉදිරිපත් කිරීමටත් මා හට මෙයින් විධාන කොට බලය පවරා දී ඇත. තවද පාර්ශවකරුවන් වෙත හා පොදු මහජනයා වෙත යථා පරිදි ප්‍රසිද්ධ දැන්වීම් කර අධිකරණ විසින් යථා පරිදි අනුමත කරනු ලබන විකිණීමේ කොන්දේසි වලට යටත්ව එකී ඉඩම හා ස්ථානය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මා හට මෙයින් තවදුරටත් අණ කොට විධාන කරනු ලැබ ඇත.

මා විසින් මෙම දේපළ හෝ පරිශ්‍රය විකුණනු ලැබුයේ කුමන මුදලකට ද, නැතහොත් මුදල්වලට ද, යන්න කවර තැනැත්තෙකුට ද, නැතහොත් තැනැත්තන්ට ද යන්නත් සහ විකුණුම් කොන්දේසි සපුරාලන ලද්දේ කවුරුන් විසින් ද යන්නත් මා විසින් මෙම අධිකරණය වෙත දැනුම් දිය යුතු වන අතර සපුරාලනු ලබන විකුණුම් කොන්දේසි මාගේ වාර්තාව සමග අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියෝග කර ඇත. තවද විකිණීමේ දී මා විසින් අයකරනු ලබන මුදල විකිණීමෙන් පසු පැය 48 ක් ඇතුලත මෙම නඩු කටයුත්තෙහි බැරට අධිකරණයට ගෙනෙන ලෙසටත් විකිණීමෙන් පසු දින 10 ක් ඇතුළත මාගේ වාර්තාව සැපයීමට විධාන කරමින් මෙම අධිකරණය විසින් මෙම අධිකාරය දීර්ඝ කල හැක්කේ යම් දිනයකට ද ඒ දිනයේ දී හෝ මාගේ වාර්තාව මෙම අධිකරණය වෙත සපයන ලෙස ද මා හට මෙයින් තවදුරටත් විධාන කරනු ලැබී ඇත.

මේ අධිකරණය විසින් නියෝග කරනු ලැබූ ආඥාවක දී හැර මේ අධිකාරය ක්‍රියාවේ යෙදවීම නොනවත්වන ලෙසට ද මාහට මෙයින් තවදුරටත් විධානය කර බලය දෙනු ලබන බවට මෙයින් අණ කොට නියෝග කර ඇති බැවින් ද, එකී තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුට ගෙවීම් කිරීමට ඉහත නම් සඳහන් විත්තිකරුවන් පැහැරහැර අපොහොසත් වී ඇති හෙයින් ද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට ඉහත 1 වන, 2 වන හා 3 වන විත්තිකරුවන් අපොහොසත් වී පැහැරහැර ඇති හෙයින්, එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති බලපත්‍රයේ බලය පිට ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ වූ,

වර්ග අඩි 1,878 ක් වූ රාජගිරිය ලේක් ඩ්‍රයිව් හි පිහිටි වරිපනම් අංක 115 - 20/6 දරන සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ A කුළුනෙහි 20 වන මහලේ අංක '1 A/F 20/U6' දරන මහලේ නිවාස ඒකකය හා ඒ මත පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ

**වර්ෂ 2025 ක් වූ පෙබරවාරි මස 01 වැනි දින පෙ.ව. 11.30 ට**

ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගේ රාජගිරිය, ලේක් ඩ්‍රයිව්, රෝයල් පාර්ක් හි අංක A - 20/06 හි දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පිවිසීම :

මේ සඳහා ප්‍රවේශය කොළඹ බොරැල්ල මංසන්ධියේ සිට කොටා පාර ඔස්සේ රාජගිරිය ආයුර්වේදය වටරවුම වෙත පැමිණ එම වටරවුමෙන් දකුණට ඇති ශ්‍රී ජයවර්ධනපුර පාර ඔස්සේ මීටර් 20 ක් පමණ රාජගිරිය දෙසට ගමන් ගත් විට දකුණු දෙසින් පිහිටි ඇළසමග පිහිටි Lake Drive පාර ඔස්සේ තවත් මීටර් 500 ක් පමණ ඉදිරියට ගිය පසු වම් දෙසින් හමුවන පාළම මතින් ඇලෙන් එගොඩ වූ පසු හමුවන රෝයල් පාර්ක් නිවාස සංකීර්ණයට ඇතුල් වී එම නිවාස සංකීර්ණයේ පිහිටි A කොටසට අයත් ගොඩනැගිල්ලේ Lift එකෙන් 20 වන තට්ටුව වෙත ගොස් එකී තට්ටුවේ දකුණ දෙස අවසානය දක්වා ගමන් ගත් විට දකුණු දෙසින්ම පිහිටි මෙකී නිවස නැමති මෙම විෂය වස්තුවට අදාළ දේපළ හමුවනු ඇත.

ගෙවීමේ ක්‍රමය :

වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. (චෙක්පත් භාරගනු නොලැබේ).

1. විකුණුම් මිලෙන් 25 % (සියයට විසිපහක්),
2. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැනුම් මිලෙන්) 2.5% (සියයට දෙකයි දශම පහයි),
3. සියලුම ප්‍රචාරක ගාස්තු,
4. මුද්දර ගාස්තු,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු,
6. ප්‍රාදේශීය සභා ගාස්තු 1% (සියයට එකක්),
7. නොතාරිස් ගාස්තු,
8. පළාත් පාලන ආයතනයන් විසින් පනවනු ලැබූ වෙනත් බදු ද, ආදිය
9. ගැණුම් මිලෙන් පළමුවන රු. 7,500/- ට රු. 150/- ක් ද ඊට අමතරව ලැබෙන සෑම රු. 1,000/- කට ම රු. 5/- බැගින් වූ අධිකරණයට ගෙවිය යුතු ගාස්තු ද, ඉතිරි 75% ක (සියයට හැත්තෑපහක්) මුදල දින 30 ක් ඇතුළත කොළඹ වානිජ මහාධිකරණයේ නඩු අංක HC (සිවිල්) 08/2009/MR දරන නඩුවේ බැරට තැන්පත් කල යුතු අතර එසේ ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් මුලින් තැන්පත් කරන ලද මුදල් ආපසු නොගෙවන අතර එකී දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට ක්‍රියා කරනු ඇත.

අධිකරණයේ අණ පරිදි,

විමසීම් හා අදාළ ඔප්පුලේඛන පරීක්ෂාව සඳහා හමුවන්න.

අජිත් දසනායක,
උසාවි කොමසාරිස්/සාම විනිසුරු (මුළු දිවයිනටම)
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු.
B.B.A. (United Kingdom)/ A.I.C.M (Sri Lanka)
Email : ajith.dasanayake@yahoo.com
Tel Mob : 072-1802348

01 - 56

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.